PR/2019/16/S

ජපන් ජනතාවගෙනි
ஜப்பானிய மக்களிடமிருந்து
From the People of Japan


**ජපන් තානාපති කාර්යාලය**

අංක 20, ශ්‍රීමත් ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව

දුරකථනය (+94-11-2693831-3, ෆැක්ස්(+94-11-2698629)

ඊමේල්: cultujpn@co.mofa.go.jp


**පුවත්පත් නිවේදනය**

2019 මාර්තු මස 19 වන දින

**ජපන් රජයෙන් යාපනය මහ නගර සභාවට කසළ ප්‍රවාහන රථ ලබා දෙයි**

ජපන් රජය මගින් එහි බිම් මට්ටමේ මානව ආරක්ෂණය සඳහා වන ආධාර ව්‍යාපෘතිය (GGP) යටතේ කසළ ප්‍රවාහන කොම්පැක්ටර් රථ යන ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් 83,432 (දළ වශයෙන් රුපියල් මිලියන 15 ක) ප්‍රදානයක් ලබාදීමට තීරණය කර ඇති අතර ඒ සඳහා වන ගිවිසුමට අත්සන් තැබීම 2019 මාර්තු 19 වන දින, ජපන් තානාපති අකිරා සුගියාමා මහතා සහ යාපනය මහ නගර සභාවේ ගරු නගරාධිපතිතුමා වන ඊ.අර්නොල්ඩ් මහතා අතර ජපන් තානාපති නිල නිවසේ දී අත්සන් තැබිය.

මෙම ව්‍යාපෘතිය තුලින් යාපනය ප්‍රදේශයේ කසළ කළමණාකරණය වැඩි දියුණු කිරීම සඳහා කසළ ප්‍රවාහන කොම්පැක්ටර් රථ 4 ක් ජපාන රජය විසින් යාපනය මහ නගර සභාව වෙත ලබා දී ඇත. මෙම වැඩි දියුණු කල කසළ ප්‍රවාහන රථ මගින් යාපනය නගරයේ පිරිසිදුකම හා සෞඛ්‍යය සම්පන්න බව පිරි පරිසරයක් ගොඩනැගෙනු ඇත. එම වාහන ජපන් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ප්‍රවර්ධනය කිරීමේ සංගමය (Society for Promotion of Japanese Diplomacy – SPJD) හරහා ලබාදීමට කටයුතු කර ඇත.

යාපනය නගරය තුල, වේගයෙන් වර්ධනය වන ආර්ථිකය හා ජනගහනය සමග, දිනකට ඝන කසළ මෙට්‍රික් ටොන් 70ක් නිපදවන ලැබේ. නමුත් කසළ එකතු කිරීමේ රථ හිඟය හෙතුවෙන් දිනකට මෙට්‍රික් ටොන් 20ක පමණ කසළ නිසිලෙස එකතු

කිරීමට නොහැකි වෙයි. මෙම නිසා පරිසරය හා ප්‍රදේශවාසින්ගේ සෞඛ්‍යය තත්වය දැඩි ලෙස බලපෑමට ලක්ව ඇත. මෙම ව්‍යාපාතිය මගින් යාපනය මහ නගර සභාවේ කසළ එකතු කිරීමේ ධාරිතාව ඉහළ නැංවීමට හැකි වේ.

යාපනය මහ නගර සභාවේ ගරු නගරාධිපතිතුමා වන ඊ.අර්නොල්ඩ් මහතා ,ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව පැවසූයේ, “යාපනය ජනතාව වෙනුවෙන් මෙම ගිවිසුමට අත්සන් තැබීම ගැන මම සතුටට පත් වෙමි. එමෙන්ම යාපනය මහ නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස, යාපනය ජනතාව වෙනුවෙන් මම මාගේ හෘදයාංගම ස්තුතිය ජපන් රජය වෙත පිරිනමන අතර මෙම ව්‍යාපාතිය අප හට ලබා දීම සම්බන්දයෙන් බෙහෙවින් ස්තුති වන්ත වෙමි. නියමිත වෙලාවට මෙම ව්‍යාපාතිය අප හට ලැබුනු අතර, එය යාපනය නගරයේ කසළ කළමණාකරණය හා වැඩි දියුණු කිරීම සඳහා මහත් පිටුවහලක් විය.

රටේ දශක තුනකට වැඩියෙන් පැවතුනු අභ්‍යන්තර අර්බුදය හෙතුවෙන් යාපනය ජනතාව ඉතා දුෂ්කර තත්වයට මුහුණපෑමට සිදුවිය. එනමුත්, යුද්ධය අවසන් වීමත් සමග, ශ්‍රී ලංකා රජය හා අනෙකුත් විදේශීය ආධාරකරුවන්ගෙන් ලැබෙන අඛණ්ඩ සහාය හා ආධාර හෙතුවෙන් මෙම තත්වය වෙනස් වීමෙන් පවතිනවා“. යාපනය මහ නගර සභාව වෙත ලබා දී ඇති කසළ ප්‍රවාහන කොම්පැක්ටර් රථ 4 මගින් කසළ කළමණාකරණය වැඩි දියුණු කිරීමට හැකි වේ. ජපාන රජයෙන් ලැබුණු මෙම රථ කාර්යක්ෂමව බාවිතා කරන බව සහතික වෙමි. එමෙන්ම අනාගතයේදි ද ජපන් රජය මගින් මෙවන් ආධාර ලැබේයැයි බලාපොරුත්තු වනවා” යැයි පැවසීය.

වැඩි විස්තර සඳහා කරුණාකර අමතන්න
ජපන් තානාපති කාර්යාලයේ ආර්ථික සහයෝගිතා අංශය
දුරකථන අංක 011-2693831 දිගුව 225
ඊමේල් : cultujpn@co.mofa.go.jp